# අධ්‍යාපන අමාත්‍යාංශය
# கல்வி அமைச்சு
# Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk


මගේ යොමුව / எனது இல. / My Ref. ED/09/12/10/03/ (I)

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2024.06.10

සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

**සුහග සිසුන් සඳහා ශිෂ්‍යත්ව වැඩසටහන**

නව නිපැයුම්, සෞන්දර්යය හා ක්‍රීඩා ක්ෂේත්‍රයන්හි සුවිශේෂී දක්ෂතා දක්වන අ.පො.ස. (උ.පෙළ) ඉගෙනුම ලබන සිසුන් සඳහා මෙම සුහග ශිෂ්‍යත්ව වැඩසටහන ක්‍රියාත්මක වේ. මේ යටතේ අ.පො.ස. (උ.පෙළ) ඉගෙනුම ලබන අවුරුදු දෙකක කාලසීමාව තුළ එක් සිසුවෙක් සඳහා උපරිමය රුපියල් 50,000/- ක් වන පරිදි වාරික වශයෙන් මෙම සුහග ශිෂ්‍යාධාර මුදල අදාළ සිසුවාගේ බැංකු ගිණුම වෙත ගෙවිය යුතු ය.

මීට අදාළව නිකුත් කර තිබූ 2020.12.15 දිනැති 34/2020 චක්‍රලේඛය සහ 2022.12.30 දිනැති 41/2022 චක්‍රලේඛය අවලංගු කරන අතර මින් ඉදිරියට ක්‍රියාත්මක වන 2024.06.06 දිනැති අංක 22/2024 දරන චක්‍රලේඛයේ උපදෙස් පරිදි කටයුතු කළ යුතු බව කාරුණිකව දන්වමි. තවදුරටත් මෙම වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කරමින් ශිෂ්‍යත්වධාරීන් නිසිලෙස නියාමනය කර ඵලදායිව වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

මීට අදාළව පහත කරුණු සම්බන්ධයෙන් ඔබගේ විශේෂ අවධානය යොමු කරවමි.

01. පළාත් /කලාප මට්ටමින් සුහග ශිෂ්‍යත්ව වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සම්බන්ධීකරණ නිලධාරියෙකු පත් කළ යුතුය.
02. චක්‍රලේඛානුකූලව සිසුන් තේරීම සිදුකර සුදුසුකම්ලත් ශිෂ්‍ය නාම ලේඛනය මෙම අමාත්‍යාංශය වෙත යොමු කිරීම සහ අනුමැතිය ලත් ශිෂ්‍ය නාම ලේඛන සඳහා ශිෂ්‍යාධාර වාරික ගෙවීම් කටයුතු කලාප අධ්‍යාපන කාර්යාලය මගින් සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතුය.
03. ශිෂ්‍යත්වලාභීන් අදාළ විදුහලේ අඛණ්ඩව ඉගෙනුම ලබන බවට විදුහල්පති මගින් නියාමනය කිරීමට කටයුතු කළ යුතුය.
04. ඔබ පළාතට අදාළව ශිෂ්‍යත්වය සඳහා අනුමැතිය ලද ශිෂ්‍ය සංඛ්‍යාවට ප්‍රමාණවත් මුදල් ප්‍රතිපාදන මෙම අමාත්‍යාංශය මගින් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු වෙත ලබා දීම සිදුකරනු ලබන අතර එම ප්‍රතිපාදන කලාප අධ්‍යාපන කාර්යාල වෙත අවශ්‍ය පරිදි වෙන් කර දීමට කටයුතු කළ යුතුය.

මෙම කාර්යය සාර්ථක කර ගැනීම සඳහා ඔබ ලබාදෙන සහයෝගය ඉතා අගයකොට සලකමි.

නව චක්‍රලේඛයෙහි සිංහල හා දෙමළ මාධ්‍ය පිටපත බැගින් මේ සමඟ ඔබ වෙත යොමු කර ඇති අතර ශිෂ්‍යත්ව වැඩසටහන සම්බන්ධ වැඩිදුර විමසීම් අධ්‍යාපන අධ්‍යක්ෂ (පාසල් කටයුතු), අධ්‍යාපන අමාත්‍යාංශය වෙතින් හෝ 011 2784845 යන දුරකථන අංකයට ඇමතීමෙන් ලබාගත හැක.

ජී.ආර්.කාරියවසම
අතිරේක ලේකම් (පාසල් කටයුතු)
ලේකම් වෙනුවට


ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister: +94112784832, +94112784825, minister.education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary: +94112784811, +94112785162, secretary.education@moe.gov.lk